# සාරාංශය


**ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුවේ න්‍යාය පත්‍රයන්ට අනුව**

# පෞද්ගලීකරණය

# ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව පෞද්ගලීකරණය

**Google Books – '*IMF, World Bank & ADB Agenda on Privatisation – Vol. 4: Sri Lanka Insurance Privatisation - Annulled as Unlawful & Illegal by Supreme Court*'**

**http://www.consultants21.com/page-1-public-interest-litigations.php**




***විශාලත්වය - 8.25" X 11" - පිටු ගණන 588***

මෙම ශ්‍රී ලංකා රජය සතු ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ නින්දිත පෞද්ගලීකරණය රටේ උත්තරීතරම අධිකරණය වන ශ්‍රේෂ්ඨාධිකරණය විසින් වැරදි සහගත, නීතිය නොතකා සහ නීති විරෝධී ලෙස සිදු කර ඇති බවට තීන්දු කොට අවලංගු කර, වෙනත් කරුණු අතර, සැලකිය යුතු ලෙස එම තීන්දුවේ මෙසේ සඳහන් කර තිබුණි.

"මෙම අධිකරණයේ ගොනු කල 7 වන වගඋත්තරකරුගේ දිවුරුම් ප්‍රකාශයේ ඔහුට ආරෝපණය කල ප්‍රකාශයේ නිවැරදිභාවය සහ සත්‍යභාවය ආලාපනය කර නොමැත. එබැවින් එයින් පැහැදිලි වන්නේ, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි කොටස් විකිණීම පසුපස වූ මූලික පෙලඹවීම ඇත්තේ ආසියා සංවර්ධන බැංකුවෙන් ණය පහසුකම් ලබා ගැනීමට අවශ්‍ය ගනුදෙනු සම්පූර්ණ කර ගැනීම සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ එකඟ වී ඇති ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රයට අනුකූලව කටයුතු කිරීම තහවුරු කිරීම බවය.! ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි කොටස් විකිණීමට අදාල අමාත්‍ය මණ්ඩල සංදේශ දෙක සළකා බලන අවස්ථාවේදී, අමාත්‍ය මණ්ඩලයට මෙය රහසක්ව තිබෙන්නට ඇති බව මම නොසිතමි."

මෙයින් වඩාත් පැහැදිලි වන්නේ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF), ලෝක බැංකුව (World Bank) සහ ආසියානු සංවර්ධන බැංකු (ADB) වල බලපෑම් සහ අනුග්‍රහය මත, ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිසංස්කරණය සඳහා පෞද්ගලීකරණය මුදුන් පමුණුවාගත් විශිෂ්ට සාධකයක් ලෙසය.

මෙම නඩුවට අදාල සියලු ලේඛන කර්තෘ විසින් පෞද්ගලිකව මෙම කරුණු සමඟ ගනුදෙනු කරමින් සකස් කරනු ලැබුවත්, යම්කිසි ප්‍රයෝගික හේතුවක් මත, කර්තෘගේ හිතවත් මිතුරෙකු වූ එවකට ජනාධිපති මහින්ද රාජපක්ෂගේ උපදේශකයෙකුද වූ සහ නීතිඥ වාසුදේව නානායක්කාර පෙත්සම්කරු ලෙස ඉදිරිපත් කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙත්සම ගොනු කරන ලද අතර, කර්තෘ රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ හිටපු සභාපති ලෙස එහි වගඋත්තරකරුවකු ලෙස නම් කරන ලදී.

එලෙස වගඋත්තරකරුවකු ලෙස, ඔහු විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ පෞද්ගලිකව පෙනී සිටීමෙන්, ඔහු විසින් විමර්ශනය කල කරුණු අනුව, වාචික සහ ලිඛිත ඉදිරිපත් කිරීම් සාර්ථක ලෙස තහවුරු කර ගෙන, ශ්‍රී ලංකාවේ මහජන උන්නතිය වෙනුවෙන් සහ මහජනයාට ඉමහත් ප්‍රතිලාභයක් අත්කර දෙමින් ශ්‍රේෂ්ඨාධිකරණයේ ජයග්‍රාහී විනිශ්චයක් ලබා ගෙන ඇත.



වාසුදේව නානායක්කාර
ජනාධිපති උපදේශක කාර්යාලය
வாசுதேவ நாணயக்கார
ஜனாதிபதி ஆலோசகர் கரியாலயம்

මහජන යහපත ශ්‍රේෂ්ඨාධිකරණයේදී අභියෝගයට ලක් වීම
ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව පෞද්ගලීකරණය සම්බන්ධිතයි

එස්.සී (එෆ්.ආර්) අයැදුම් අංක 158/2007

ඉහත ශෛලියේ ක්‍රියාව මා විසින් ආරම්භ කරන ලද්දේ, නිහාල් ශ්‍රී අමරසේකර මහතාගේ අව්‍යාජ ඉල්ලීම මත වන බවට තහවුරු කරන අතර, සියලුම ලේඛනයන් නීතිඥයන්ගේ උපදෙස් අනුව ඔහු සහ ඔහුගේ කාර්යාලය විසින් සකස් කරන ලදී.

අමරසේකර මහතා වගඋත්තරකරුවකු ලෙස තමා නම් කරමින්, පුළුල්ව ලිඛිත හා වාචික කරුණු ඉදිරිපත් කරමින් පුද්ගලයෙකු තුළ පෙනී සිටිමින් කටයුතු කළ අතර, ලංකා හොස්පිටල්ස් ඇතුළුව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව පෞද්ගලීකරණය කිරීම වැරදි සහගත, අයුතු, නීති විරෝධී සහ වංචා සහගත බවට සළකා අවලංගු කර, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් යළි රාජ්‍ය අයිතියට පත් කිරීම ඔහුගේ බලවත් උත්සාහයෙහි ප්‍රතිඵලයකි.

නිහාල් අමරසේකර මහතා සමඟ වන මාගේ දිර්ඝ කාලීන ස්ථාවර පෞද්ගලික මිත්‍රත්වය හේතුවෙන්, මාගේ පරම විශ්වාසය දිනාගත් ඔහු නිර්ව්‍යාජ ලෙස කටයුතු කරන බවට වන විශ්වාසය මත මා විසින් පෙත්සම්කරු ලෙස කටයුතු කිරීමට කැමැත්ත පල කළෙමි.

වාසුදේව නානායක්කාර, පා.ම.

49,1/1, විනයාලංකාර මාවත, කොළඹ - 10.
☎ 011-5874361 🖷 011-5863938

49,1/1, வினயாலங்கார வீதி, கொழும்பு - 10
☎ 011-5874361 🖷 011-5863938

රාජ්‍ය ව්‍යාපාර පිලිබඳ කාරක සභාව (COPE) විසින් විගණකාධිපතිගේ විමර්ශනාත්මක වාර්තා මත, විශේෂ ලෙස මෙම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ පෞද්ගලීකරණ ගනුදෙනුව, එවකට රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සභාපති වූ කර්තෘගේ සහායද ඇතුව, විමර්ශනය කොට, එය බැලු බැල්මට වංචාසහගත නීත්‍යානුකූල නොවන බව නිගමනය කරමින්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට පහත සදහන් වාර්තාව ඉදිරිපත් කරන ලදී.

**" ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි (SLIC) කොටස් 90 %ක් විකිණීම**

1. අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව, ගරු. අමාත්‍ය මිලින්ද මොරගොඩ විසින්, 2002.1.21 දින, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි කොටස් 90 % ක් විකිණීම මෙහෙයවීම සඳහා මෙහෙයුම් කමිටුව පත් කර ඇත.

2. අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව, මෙහෙයුම් කමිටුව විසින්, 2002.4.10 දිනැතිව, ඇමරිකානු ඩොලර් මිලියන 1.6 ක ගාස්තුවක් මත, ප්‍රයිස්වෝටර්හවුස්කූපර්ස් (පීඩබ්ලිව්සී) ශ්‍රී ලංකා සමග සහයෝගීත්වයෙන් ප්‍රයිස්වෝටර්හවුස්කූපර්ස් (පීඩබ්ලිව්සී), ඉන්දුනීසියා, රජයේ උපදේශකවරුන් වශයෙන් පත් කර ඇත. (වර්තමානයේදී එය ශ්‍රීලංකාවේ අනුපාතය අනුව රු. මිලියන 172.8 කි.)

3. තාක්ෂණික ඇගයීම් කමිටුව පත් කිරීම සඳහා 2002.4.18 දිනැතිව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබ ඇත. - ඒ වන විටත් 'පීඩබ්ලිව්සී' තෝරා ගෙන ඇත.

4. මහාභාණ්ඩාගාර ලේකම් විසින් තාක්ෂණික ඇගයීම් කමිටුව පත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇති නමුත්, මහාභාණ්ඩාගාර ලේකම් ඔහු විසින් ටෙන්ඩර්

මණ්ඩලය පත් කිරීමට කරනු ලැබූ ඉල්ලීම ප්‍රතික්ෂේප කර, ටෙන්ඩර් මණ්ඩලය අමාත්‍ය මණ්ඩලය විසින් පත් කල යුතු බවට තීරණය කර ඇත.

5. අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය නොලැබීම නොසළකා හරිමින්, මහාභාණ්ඩාගාර ලේකම් විසින් ඔහුවම සභාපති වශයෙන් පත් කර, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන ටෙන්ඩර් මණ්ඩලය (සීඒටීබී) පත් කිරීමට මහාභාණ්ඩාගර නියෝජ්‍ය ලේකම්හට කටයුතු කිරීමට හේතු වී ඇත.

6. ලංසු ඇගයීම සිදු කිරීමෙන් පසුව, අයිඑන්ජී ආයතනික සහ රාජ්‍ය උපදේශක සේවාව (හොලන්ඩ්) සමඟ එක්ව, ඩිස්ටිලරීස් කම්පැනි ඔෆ් ශ්‍රී ලංකා සමාගම, ඒට්කන් ස්පෙන්ස් සහ සමාගම, ඒට්කන් ඉන්ෂුවරන්ස් (පෞද්ගලික) සමාගම ඇතුලත් ව්‍යාපාර සමූහය වෙත, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ 90 % කොටස් විකිණීමට, 2003.3.25 දිනැතිව නිර්දේශ කර ඇත.

7. එදිනම, එනම් 2003.3.25 දිනම 'සීඒටීබී' විසින් තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශයන්, නිර්දේශ කර ඇත.

8. ඉහත ව්‍යාපාර සමූහය වෙත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ 90 % කොටස් විකිණීම, 2003.3.27 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් නිර්දේශ කර ඇත.

9. මිල්ෆෝඩ් හෝල්ඩිංග්ස් (පෞද්ගලික) සමාගම, සහ අක්වෙරළ සමාගමක් වූ, 2003.3.28 දින ජිබ්‍රෝල්ටාහි සංස්ථාපිත ග්‍රීන්ෆීල්ඩ් පැසිෆික් ඊඑම් හෝල්ඩිංග්ස් ලිමිටඩ් සමඟ, කොටස් විකිණීමේ සහ මිලදී ගැනීමේ ගිවිසුම, 2003.4.11 දිනැතිව අත්සන් කරන ලදී. අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලද 2003.3.27 දින වන විට එම සමාගමෙහි පැවැත්මක් නොතිබුණි.

10. මෙම සමාගම් දෙක ලංසු ඉදිරිපත් කල අය නොවූ අතර, ඔවුන් අමුත්තන් විය.

11. එකී විකිණීම, විගණනය නොකල ගිණුම් මත පදනම්ව සිදු කරනු ලැබූ අතර, එබැවින් එවැනි කිසිදු අයුරක කොටස් ගනුදෙනුවකට ඇතුලත් වීම සුදුසු නොවේ. එසේම එම ගිණුම් කූට ලෙස හොර රහසේ සහ චේතනාවෙන් යුතුව සිදු කර ඇති බව පෙනී යයි.

12. එකී වංචා සහගත කාර්යය සඳහා අර්න්ස්ට් ඇන්ඩ් යංග් සහ පීඩබ්ලිව්සී උපදේශකයින් ඍජුවම සම්බන්ධ වී ඇත.

13. 'පීඩබ්ලිව්සී' හි ජ්‍යෙෂ්ඨ හවුල්කාර දේව රොද්‍රිගු, රජයේ උපදේශකයින් ලෙස 'පීඩබ්ලිව්සී' ව තෝරා ගනු ලැබූ මෙහෙයුම් කමිටුවෙහි සාමාජිකයකු වන අතර, එයින් පසුව, මෙහෙයුම් කමිටු සාමාජිකයක් ලෙස 'පීඩබ්ලිව්සී' හි කටයුතු අධීක්ෂණය කිරීමේ කටයුතු සිදු කරමින්, 'පීඩබ්ලිව්සී' හි ගෙවීම් සිදු කිරීමට අනුමැතිය ලබා දී ඇත.

14. පර්ක් හි සභාපති සහ මෙහෙයුම් කමිටුවේ ලේකම් ලෙස පර්ක් වෙනුවෙන් මෙම ගනුදෙනුව මෙහෙය වූ අනීලා ද සොයිසා, 2003 මාර්තු මස 'පීඩබ්ලිව්සී' හි හවුල්කරුවකු ලෙස එයට සම්බන්ධ වී ඇත.

15. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි 100% ක අයිතිය රජය සතුව තිබියදී, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි විගණකයින් වූ අර්නස්ට් ඇන්ඩ් යංග්, නීති විරෝධී ගැනුම්කරුවන්හට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විකිණීමෙන් පසුව, එහි විගණකවරුන් ලෙස කටයුතු කරමින්, ඔවුන් සමඟ සමඵයකට පත්ව කටයුතු කරමින්, රජය වෙනුවෙන් ඔවුන්ගේ වගකීම් ඉටු නොකරන ලදී.


16. වෙළඳ කටයුතු අමාත්‍යවරයාගේ විෂය සීමාව යටතට එන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආචාර ධර්ම කමිටුව විසින් සිදු කරනු ලැබූ මූලික විමර්ශනයන්ගෙන් අනතුරුව, බැලූ බැල්මට පෙනෙන වරදක් සිදු කර ඇති බවට ස්ථාපිත වෙමින්, වෘත්තීයමය විෂමාචාරයක් සිදුව ඇති බව සොයා ගන්නා ලද අතර, අර්නස්ට් ඇන්ඩ් යංග් සහ පීඩබ්ලිව්සී පැවැත්ම සම්බන්ධයෙන් නීතිය මගින් විධාන කර ඇති පරිදි පරීක්ෂණයක් පැවැත්වීම සඳහා විනය කමිටුවක් පත් කරන ලෙස නිර්දේශ කරන ලදී.

17. පර්ක් හි සභාපති / ජ්‍යෙෂ්ඨ උපදේශක වශයෙන් මෙම ගනුදෙනුව මෙහෙය වූ එයින් පසුව, මහාභාණ්ඩාගාරයේ ලේකම් ලෙස පත් වූ ආචාර්ය පී. බී. ජයසුන්දර, අර්නස්ට් ඇන්ඩ් යංග් හි ජ්‍යෙෂ්ඨ ප්‍රතිපත්ති උපදේශක වූ බැවින්, රජයේ යහපත ආරක්ෂා කිරීමට පියවර ගැනීමට අපොහොසත් වූ අතර, එසේ කටයුතු කිරීම නොසළකා හැර කටයුතු කරන ලදී.

18. ඉහත ගනුදෙනුවේ කරුණු සහ සිදුවීම් සැළකීමේදී මුල පටන්ම ශූන්‍ය සහ බලරහිත වන අතර ව්‍යර්ථීකෘත වේ. බැලූ බැල්මට පෙනෙන පරිදි, වගකිවයුතු නිලධාරීන්ගේ හැසිරීම මහජන දේපල පනත සහ අල්ලස් හා දූෂණ නීති වල ප්‍රතිපාදනයන් උල්ලංඝනය කර ඇත. අප අනුකමිටුවේ නිර්දේශයන් ලැබෙන තුරු බලා සිටින්නෙමු."

පුදුමාකාර ලෙස, පිලිගත් වරලත් ගණකාධිකාරී සමාගම් වන, එනම්, ප්‍රයිස් වෝටර්හවුස්කූපර්ස්, ශ්‍රී ලංකා රජයේ උපදේශකවරුන් ලෙසත් සහ අර්නස්ට් ඇන්ඩ් යන්ග් වරලත් ගණකාධිකාරී සමාගම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ විගණකවරුන් ලෙසත් කටයුතු කරමින්, වෘත්තීය සම්මතයන්, ප්‍රමිති සහ ආචාර ධර්ම උල්ලංසනය කරමින්, ප්‍රශ්නකාරී වැරදි සහගත, නීතිය නොතකා, නීති විරෝධී ලෙස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව පෞද්ගලීකරණය කිරීම තුලින්, ශ්‍රී ලංකා රජයට සහ මහජනතාවට දැවැන්ත අලාභයක් සිදු කර ඇත.

ශ්‍රී ලංකා රජය සතු ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ 90% ක කොටස් මිලදී ගැනීම සඳහා අයදුම් කිරීමට කැමති පාර්ශවයන්ගෙන් ප්‍රයිස්වෝටර්හවුස් කූපර්ස් විසින් උනන්දුව දැක්වීමේ ප්‍රකාශ (EOI) කැඳවනු ලැබ, එම අයදුම්පත් තාක්ෂණික ඇගයීම් කමිටුවක් විසින් පරීක්ෂා කිරීමෙන් අනතුරුව, ලංසු ඉදිරිපත් කිරීම සඳහා කිසියම් පාර්ශවයන් පිරිසක් පිරිමිතිය අනුව තෝරාගෙන තිබුණි.



Public Enterprises Reform Commission of Sri Lanka — Government of Sri Lanka

**Invitation for Expressions of Interest in Sri Lanka Insurance Corporation Ltd. Closing date for Expressions of Interest 23 August 2002**

**The Government of Sri Lanka (GOSL) has invited Expressions of Interest (EoI) in Sri Lanka Insurance Corporation Ltd. (SLIC). This is to notify that the closing date for submission of EoI is 23rd August 2002. Prospective investors who have not submitted their EoI as yet are requested to submit EoI by mail or fax on or before 1700 hours Sri Lanka Time on 23 August 2002 to any of the Advisors listed below.**

**Proposed Transaction**
SLIC is a wholly-government owned life and general insurance company. The GOSL through the Public Enterprises Reform Commission is requesting EoI in respect of the proposed sale of a majority stake of up to 90% of SLIC, with a possible option to purchase 10% allocated to the employees.

**Investment Highlights**
- Opportunity to acquire ownership and management control of a profitable life and general insurance company, which has the leading market position in Sri Lanka
- Sri Lankan insurance market has relatively low levels of penetration and consequently offers the potential for future growth
- Robust legal framework in Sri Lanka, including the Regulation of Insurance Industry Act No. 43 of 2000 which is currently in force, provides assurance to potential investors
- Insurance market is fully liberalised and foreign investors are permitted to own up to 100% of a domestic insurance company

**Further Information**
A brief information profile is available from any of the Financial Adviser contacts listed below in this notice. Further information on SLIC is also available on its website: www.srilankainsurance.com

**Pre-Qualification Criteria**
EoI are sought from prospective investors comprising life and general insurance companies, financial services companies or consortia that may include insurance operational experience along with financial and/or other investors. EoI from parties wishing to join consortia or be introduced to potential co-investors in the sale process are also welcomed. EoI should demonstrate evidence of sufficient financial capacity to fund the acquisition of SLIC and outline how they would provide for the expertise and capability to operate and further develop SLIC.

**Form of Expression of Interest**
Each EoI should provide the following:
- Full name of the company and the contact person, postal address, telephone, fax number and e-mail address
- Details of ownership structure and company profile
- Audited financial statements for the last three years
- Where relevant, operational capabilities:
  - years of operation in the insurance industry
  - total number of policyholders
  - range of products and services provided
  - details of countries of operation

**Proposed Timetable**
Shortlisted investors will be contacted after assessment of EoI and, once they have executed a confidentiality agreement, will be provided with an Information Memorandum. The Government's objective is to conclude the transaction before the end of 2002.


**Contact Details**
Inquiries and requests for the information profile should be directed to the Financial Adviser, PricewaterhouseCoopers

**Channa Manoharan**
**PricewaterhouseCoopers, Colombo**
**P.O. Box 918, 100 Braybrooke Place**
**Colombo 02, Sri Lanka**
**Tel: +94 74 719838**
**Fax: +94 1 342389**
**Email: channa.manoharan@lk.pwcglobal.com**

PRICEWATERHOUSECOOPERS

**Roger de Montfort or Paul Reddel**
**PricewaterhouseCoopers,**
**Jl. H.R. Rasuna Said, Kav C-3**
**Jakarta 12920, Indonesia**
**Tel: +62 21 521 2901**
**Fax: +62 21 521 2144**
**E-mail: roger.de.montfort@id.pwcglobal.com**
**paul.reddel@id.pwcglobal.com**

අමාත්‍ය මණ්ඩල විසින් පත් කල ටෙන්ඩර් මණ්ඩලයක් පත් කිරීම සඳහා, අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී නොතිබුණද, එසේ සිදු කල එවැනි නිශ්චිත අමාත්‍ය මණ්ඩල තීරණයද නොසලකා, භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් විසින් පහත සඳහන් ලිපිය පරිදි, අමාත්‍ය මණ්ඩලය පත් කල ටෙන්ඩර් මණ්ඩලයක් සහ තාක්ෂණික ඇගයීම් කමිටුවක්, සංස්ථාපිත කර ඇත. - එනම්:



DEPARTMENT OF PUBLIC FINANCE

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව

PF/PSB/CT/B/54/04

Secretary,
Ministry of Economic Reform, Science & Technology

**Restructure of Sri Lanka Insurance Corporation Ltd. (SLIC)**

Reference to the letter. of the Chairman of PERC dated 29th July 2002, addressed to the Secretary regarding the above matter.

02. I wish to inform you that the following permanent Cabinet Appointed Tender Board has been assigned to handle the above tender.

1. Mr. N.Pathmanathan - Chairman
Deputy Secretary to the Treasury
2. Mr. R.Tharmakulasingham - Member
Secretary, Ministry of Assisting Vanni Rehabilitation
3. Mr. J.P.Hettiarachchi - Member
Addl.Secretary, Ministry of Co-operatives

03. The following officers have been appointed to the TEC.

1. Mr. Sunil Wijesinghe, - Chairman
Managing Director, Merchant Bank of Sri Lanka
2. Mr Leel Wickramaarachchi, - Member
CEO/GM, Private Sector Infrastructure Development
3. Mr. G.G.de Silva, - Member
Legal Consultant, Central Bank of Sri Lanka
4. Dr. R.H.A.Samaratunga,
Director, Dept.of National Planning - (Treasury Representative)

Your attention is invited to the Guidelines Nos. 109.6 and 38 of Guidelines on Government Tender Procedure and requested to release these officers on full time basis in order to complete tender evaluation within the specified period.

04. I would like to draw your attention to the Public Finance Circular No. FIN 358(4) of 29th November 1999 and shall be thankful if a Procurement Activity Schedule (PAS) (Annex3) is prepared for the tender at the Procurement Planning meeting or first meeting of the Tender Board. This schedule should be submitted to this department and also intimated to the other relevant authorities in terms of this circular.

05. You are kindly requested to adhere to the instructions given in the Public Finance Circulars No. FIN 358 (4) and to submit duly filled PAS and monthly Tender progress report to the PSB.

06. Every effort should be made to complete the tender process within the periods specified in the agreed Procurement Activities Schedule (PAS). The PAS should be set using the periods indicated in Time Frame Guide I Annex 5 of Public Finance Circular FIN 358(4) of 29th November 1999.

W.D.Jayasinghe
Addl.Director General of Public Finance

Sgd. N.Pathmanathan
Deputy Secretary
to the Treasury

Copies to:-

1. Mr. N.Pathmanathan - Chairman
Deputy Secretary to the Treasury
2. Mr. R.Thamakulasingham - Member
Secretary, Ministry of Assisting Vanni Rehabilitation
3. Mr. J.P.Hettiarachchi - Member
Addl.Secretary, Ministry of Co-operatives
4. Dr.R.H.A.Samaratunga,
Director, Dept.of National Planning) - Detail of the tender are attached.
(Treasury Representative
5. Monitoring Unit PSB

මවිතයට පත් වන ලෙස, මෙම ග්‍රන්ථයෙන් එළිදරව් වන්නේ, පෙර සුදුසුකම් සඳහා අයදුම් නොකල, හැරී ජයවර්ධන විසින් සමාගම් සමූහයකට නායකත්වය දුන්, එට්කන්ස් ස්පෙන්ස් සමාගමද ඇතුලත් ශ්‍රී ලංකා ඩිස්ටිලරිස් සමාගම ප්‍රමුඛ ව්‍යාපාර සමූහය වෙතට පසුව චමත්කාරජනක ලෙස ලංසු ක්‍රියාවලිය සඳහා සහභාගි වීමට අවසර ලබා දීමය.

හිටපු භාණ්ඩාගාරයේ ලේකම් පී. බී. ජයසුන්දර විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කර තිබූ 2007.11.21 දිනැති දිවුරුම් ප්‍රකාශයේ පුදුමාකාර ලෙස ප්‍රකාශ කර ඇත්තේ - “ *මෙවැනි සුපුරුදු ස්වභාවයේ ගනුදෙනු වලදී, ලංසුකරුවන් සඳහා ව්‍යාපාර සමූහ පිහිටුවීම සහ ඒ තුලින් ව්‍යාපාර සමූහයන්ට ලංසු ක්‍රියාවලිය වෙනස් කිරීමට හැකි බව* " සහ එමගින් තාක්ෂණික ඇගයීම් ක්‍රියාවලිය 'හුදු විහිලුවක් බව' පිලිඹිබු කොට ඇත.

තවද, ඉහත සඳහන් මෙම ක්‍රියාදාම සිද්ධීන් වල අපරීක්ෂාකාරීත්වය සහ පුදුමාකාර හදිසි ක්‍රියාදාමය එළිදරව් වන්නේ, තාක්ෂණික ඇගයීම් කමිටු රැස්වීම 2003.3.25 දින පෙ.ව. 9.30 ට කොළඹ 1, ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ බටහිර කුළුණේ, 11 මහලෙහි පිහිටි රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා කාර්යාලයේ පවත්වා, එහිදී ශ්‍රී ලංකා ඩිස්ටිලරිස් සමාගම නායකත්වය දුන් සමාගම් සමූහය විසින්, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ 90% රජයේ කොටස් රු. මිලියන 6050 ක මිලට මිලදී ගැනීම සඳහා ඉදිරිපත් කල ලංසු පිළිගෙන සහ නිර්දේශ කර, ඒ අනුව විකිණීමට කටයුතු කිරීමය.

ඉන් අනතුරුව පැය භාගයක් ඇතුලත, ඉහත කී තාක්ෂණික ඇගයීම් කමිටු රැස්වීමේ නිර්දේශයන්හි සටහන් සළකා බැලීමට, අමාත්‍ය මණ්ඩලය පත් කල ටෙන්ඩර් මණ්ඩලය විසින් පෙ.ව. 10.00 ට වෙනත් ස්ථානයක පිහිටා ඇති කොළඹ 1, මුදල් අමාත්‍යාංශයේ මහා භාණ්ඩාගාර ශ්‍රවණාගාරයේදී හමුවී, එම සටහන් අනුමත කර ගැනීම හේතුවෙන්, එමගින් එසේ කඩිමුඩියේ මෙය සිදු වූ ආකාරය පිළිබඳ ප්‍රශ්නයක් මතු වේ. - එනම්.

Annex 1.35

MINUTES OF THE MEETING FOR TECHNICAL EVALUATION COMMITTEE
ON THE RESTRUCTURE OF
SRI LANKA INSURANCE CORPORATION LTD

Held at 9.30 a.m. on March 25, 2003 at the Public Enterprises Reform Commission, Level 11-0, West Tower, world Trade Centre, Colombo – 01.

Present:

Members of the Technical Evaluation Committee
Mr Leel Wickremarachchi, CEO/GM, Private Sector Infrastructure Development
Mr E Arumugam, Director General, Public Finance, Ministry of Finance
Dr R H S Samaratunga, Director, Dept of National Planning (Treasury Representative)
Mr N Meemaduma, Director General, Ministry of Economic Reform, Science & Technology

Present at the Meeting - Financial Advisors

~~Mr Channa Manoharan, Pricewaterhouse Coopers~~
Ms Aneela de Soysa, Director, Pricewaterhouse Coopers

In Attendance:

Ms Piyumica Wijeweera, Manager, PERC
Ms Lumbini Kulasekera, Manager, PERC

The Technical Evaluation Committee (TEC) considered Attachment 1, which sets out the Report of the Financials Advisors on the Bid for 90% of the shares of Sri Lanka Insurance Corporation Ltd (SLIC) and decided to recommend acceptance of the bid for 90% of shares of SLIC at a price of Rs 6,050 Mn submitted by the consortium comprising Distilleries Co Ltd. Aitken Spence & Co Ltd Aitken Spence Insurance together with their Technical Partner, ING. Institutional & Government Advisory Services B.V. (Holland) together with Institutional Investors.

Mr Leel Wickremarachchi ..................
Dr R H S Samaratunga ..................
Mr E Arumugam ..................
Mr N Meemaduma ..................

March 25, 2003. 173

Annex 1.36

MINUTES OF THE 11TH CABINET APPOINTED TENDER BOARD (CATB)
ON THE RESTRUCTURE OF
SRI LANKA INSURANCE CORPORATION LTD

Held at 10.00 a.m. on March 25, 2003 at the Treasury Auditorium, Ministry of Finance General Treasury, Colombo – 01.

Present:

Members of the Cabinet Appointed Tender Board (CATB)

Mr N Pathmanathan, Deputy Secretary to the Treasury, Ministry of Finance
Mr Jayampathy P Hettiarachchi, Addl Secretary, Ministry of Co-operatives
Mr Dharmasena Dissanayake, Secretary, Ministry of Eastern Development & Musl Affairs

Present at the Meeting - Financial Advisors

Ms Aneela de Soysa, Partner, Pricewaterhouse Coopers

In Attendance:

Ms Lumbini Kulasekera, Manager, Public Enterprises Reform Commission

The Cabinet Appointed Tender Board (CATB) considered the minutes of the meeting of Technical Evaluation Committee (TEC) held on March 25, 2003 recommending the prefe bidder for the sale of shares of Sri Lanka Insurance Corporation Ltd (SLIC) attached herew The CATB agreed with the recommendation of the TEC on the sale of 90% of the shares SLIC at a price of Rs 6,050 Mn to the consortium comprising Distilleries Co Ltd., Aitken Spe & Co Ltd, Aitken Spence Insurance together with Institutional Investors along with th Technical Partner, ING. Institutional & Government Advisory Services B.V. (Holland).

The CATB noted that :

- The bidder has agreed to purchase upto 10% of the shares which the employ will be gifted at the same sale share price at which the shares were purchased the Investor in the event the employees wish to sell the shares.
- It is proposed that a dividend of upto Rs 750 Mn be declared by the SLIC to Government of Sri Lanka (GOSL) prior to the sale of the shares and

Contd

Annex 1.36 (continued)

- The bidder has indicated agreement to pay to the Government the increase if any of the Net Working Capital during the period 31 March 2003 to the date of the sale of the shares within 2 months of the close of the transaction. In the event the net working capital for the period has decreased, that amount will have to be paid to the bidder by the GOSL. The change in net working capital is to be determined by way of reference to the accounts prepared in accordance with International Accounting Standards.

Mr N Pathmanathan ( CATB -Chairman) ..................
Mr Jayampathy Hettiarachchi ..................
Mr Dharmasena Dissanayake ..................

March 25, 2003.

ඉන් අනතුරුව, ශ්‍රී ලංකා ඩිස්ටිලරිස් සමාගම විසින් නායකත්වය දුන් සමාගම් සමුහයට, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ 90% ක කොටස් රු. මිලියන 6050 කට මිලදී ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර තිබුණේ, අමාත්‍ය මණ්ඩලය පත් කල ටෙන්ඩර් මණ්ඩලයේ නිර්දේශය සහ ආර්ථික ප්‍රතිසංස්කරණ අමාත්‍ය මිලින්ද මොරගොඩ විසින් ඉදිරිපත් කල 2003.3.27 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව වන අතර, එමගින් මෙම ගනුදෙනුව අවසන් කිරිමට තිබූ හදිසිය ආදර්ශනය කරයි.

එනමුත්, එයටත් වඩා බේදජනක සහ විශ්මජනක වන්නේ, එයින් කෙටි දිනකට පසුව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ 90% ක කොටස් මිලදී ගැනීමට, විකිණීම සහ මිලදී ගැනීමේ ගිවිසුමට 2003.4.11 දිනැතිව අත්සන් තබා තිබුණේ, 2003.3.27 දින ඉහත අමාත්‍ය මණ්ඩල සංදේශය මත, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කල ඉහත කී පාර්ශවයන් නොව, වෙනත්ම නව පාර්ශ්වකරුවන් දෙදෙනකු වන, එනම් මිල්ෆර්ඩ් හෝල්ඩිංග්ස් (පුද්) සමාගම සහ 2003.3.28 දින ජිබ්‍රෝල්ටාවේ සංස්ථාපිත කර තිබූ ග්‍රීන්ෆිල්ඩ් පැසිෆික් ර්එම් හෝල්ඩින්ස් සමාගම බවත් සහ එසේ සිදු කරනු ලැබූවේ එහි සැබෑ හිමිකරුවන් කවුරුන්ද යන වග හෝ නොදනිමින් බවත් වීමය. - *එනම්:*

## Certificate
## of the Incorporation of a Company

No. of Company : 87757

IT IS HEREBY CERTIFIED that

**GREENFIELD PACIFIC EM HOLDINGS LIMITED**

is this day incorporated under the Companies Ordinance and that the company is limited.

Given at Gibraltar, this 28th day of March Two Thousand and Three.

REGISTRAR OF COMPANIES GIBRALTAR

For and on behalf of the Registrar of Companies

ඉහත ග්‍රීන්ෆිල්ඩ් පැසිෆික් ඊඑම් හෝල්ඩින්ස් සමාගම, අනාවරණය කර තිබෙන ආකාරයට එය සී/ස හැම්රෝස් (ජිබ්‍රෝල්ටා නාමිකයින්) සමාගමට සම්පූර්ණ අයිති බවත්, එම සමාගමේ සම්පූර්ණ අයිතිය සී/ස එස්ජී හැම්රෝස් බැන්ක් ජිබ්‍රෝල්ටා සමාගම සතු වූ බවත්, සහ එහි පූර්ණ අයිතිය එක්සත් රාජධානියේ ලන්ඩන් නුවර සී/ස එස්ජී හැම්රෝස් බැන්ක් සමාගම සතු වූ බවත්, එහි පූර්ණ අයිතිය සතුව තිබුණේ ප්‍රංශයේ පැරිස් නුවර සෝසයිටි ජේනරලේ එස්ජ් සමාගම සතුව බවත්ය. එම සමාගම විදේශ රටවල භාරකාර ආයතන හරහා විදේශ ආයෝජන කිරීමේ සේවයක් ලබා දෙන ආයතනයකි. - එනම්:

SG
Private Banking

**SG Hambros**

**TO WHOM IT MAY CONCERN**

I confirm that the sole shareholder of **Greenfield Pacific EM Holdings Limited**, a Company duly incorporated on the 28th March 2003 under the provisions of the Companies Act of Gibraltar, Company No. 87757 and having its registered office at 32 Line Wall Road, Gibraltar, is:

**Hambros (Gibraltar Nominees)** Limited of 32 Line Wall Road, Gibraltar.

F Imossi

Dated this 2nd day of August 2007

SG Hambros Bank (Gibraltar) Limited
P O Box 375
Hambro House
Line Wall Road
Gibraltar

Tel: +350 74880
Fax : +350 79037

Registered Office:
32 Line Wall Road
Gibraltar
Registered in Gibraltar No 1294

SOCIETE GENERALE GROUP

SG
Private Banking

**Fax**

**SG Hambros**

| | | | |
|---|---|---|---|
| To: | Mr Don H S Jayawardena | Tel. Fax | 009411 2526695 |
| From | Francis Imossi | Tel. Fax. | (350) 41365 (350) 79037 |
| Date | 19th July 2007 | | |
| Page | 1 | | |

Subject Hambros (Gibraltar Nominees) Limited

Dear Mr Harry

As requested, I confirm that the shareholder of Hambros (Gibraltar Nominees) Limited is SG Hambros Bank (Gibraltar) Limited.

With kind regards,

Yours sincerely,

Francis Imossi
Private Banking Officer
Direct tel. No. (350) 41365

Confidentiality notice. This fax and the information it contains may be confidential and is intended solely for the use of the named addressee. If you have received this fax in error, please contact us immediately by fax or by telephone on the above numbers. You should not disclose the contents to any other person.

SG Hambros Bank (Gibraltar) Limited
P O Box 375
Hambro House
Line Wall Road
Gibraltar

Tel: +350 74880
Fax : +350 79037

Registered Office:
32 Line Wall Road
Gibraltar
Registered in Gibraltar No 1294

SOCIETE GENERALE GROUP

SG
Private Banking

**Fax**

SG Hambros

| | | | |
|---|---|---|---|
| To: | Mr Don H S Jayawardena | Tel.<br>Fax. | <br>009411 2526895 |
| From | Francis Imossi | Tel.<br>Fax | (350) 41365<br>(350) 79037 |
| Date | 24th July 2007 | | |
| Page | | | |
| Subject | SG Hambros Bank (Gibraltar) Limited &<br>SG Hambros Bank Limited | | |

TO WHOM IT MAY CONCERN

I confirm that the shareholder of SG Hambros Bank (Gibraltar) Limited is SG Hambros Bank Limited of 41 Tower Hill, London EC3N 4SG.

I also confirm that the shareholder of SG Hambros Bank Limited is Société Générale S.A. which has its headquarters at 29, Boulevard Haussmann 75009 Paris, France.

F Imossi

Confidentiality notice: This fax and the information it contains may be confidential and is intended solely for the use of the named addressee. If you have received this fax in error, please contact us immediately by fax or by telephone on the above numbers. You should not disclose the contents to any other person.

SG Hambros Bank (Gibraltar) Limited
P O Box 375
Hambro House
Line Wall Road
Gibraltar

Tel: +350 74850
Fax: +350 79037

Registered Office
32 Line Wall Road
Gibraltar
Registered in Gibraltar No 1294

SOCIETE GENERALE GROUP

SG HAMBROS BANK LIMITED (FORMERLY SG HAMBROS BANK & TRUST LIMITED)

Report of the Directors and Financial Statements

31 December 2006

PRINCIPAL ACTIVITIES AND BUSINESS REVIEW

The Bank and its subsidiaries form the private banking arm of the Société Générale Group ("SG Group") in the UK, the Channel Islands, Gibraltar and the Bahamas. The Bank offers its international on-shore and offshore clientele an integrated wealth management service, including the provision of banking products and trust structures as well as investment management advice. On 12 January 2007 the bank changed its name to SG Hambros Bank Ltd, formerly SG Hambros Bank & Trust Ltd.

**එකී විකිණීමේ සහ මිලදී ගැනීමේ ගිවිසුමට, සියලු පාර්ශවයන් වෙනුවෙන් ඉහත කී හැරී ජයවර්ධන විසින්ම අත්සන් තබා ඇත. - එනම්:**

**DATED 11TH APRIL 2003**

**(1) THE GOVERNMENT OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA**

**(2) MILFORD HOLDINGS (PRIVATE) LIMITED AND GREENFIELD PACIFIC EM HOLDINGS LIMITED**

**(3) DISTILLERIES COMPANY OF SRI LANKA LIMITED, AITKEN SPENCE & COMPANY LIMITED AND AITKEN SPENCE INSURANCE (PRIVATE) LIMITED**

**AGREEMENT**

**in respect of the sale and purchase of the entire issued share capital of Sri Lanka Insurance Corporation Limited**

Signed by Faiz Mohideen
ACTING SECRETARY TO THE TREASURY for and on behalf of THE GOVERNMENT OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA
in the presence of:

Witnesses:
1. ....................
Name: G HETTIGAMA. CHAIRMAN,
Address: PERC, COLOMBO-01.
2. ....................
Name: M M D S GUNARATNE, DIRECTOR GENERAL,
Address: PERC, COLOMBO-01

Signed by Don Harold Stassen Jayawardene
for and on behalf of DISTILLERIES COMPANY OF SRI LANKA LIMITED
in the presence of:

Witnesses:
1. ....................
Name: MRS. H M N S GUNAWARDANA, DIRECTOR LEGAL,
Address: PERC, COLOMBO-01.
2. ....................
Name: R K OBEYESEKERE
Address: 833, SIRIMAVO BANDARANAIKE MAWATHA, COLOMBO-14.

Signed by Don Harold Stassen Jayawardene
for and on behalf of AITKEN SPENCE & COMPANY LIMITED
in the presence of:

Witnesses:
1. ....................
Name: C R JANSZ
Address: 833, SIRIMAVO BANDARANAIKE MAWATHA, COLOMBO-14.
2. ....................
Name: L U D FERNANDO
Address: 110, NORRIS CANAL ROAD, COLOMBO-10.

Signed by Don Harold Stassen Jayawardene
for and on behalf of AITKEN SPENCE INSURANCE (PRIVATE) LIMITED
in the presence of:

Witnesses:
1. ....................
Name: C R JANSZ
Address: 833, SIRIMAVO BANDARANAIKE MAWATHA, COLOMBO-14.
2. ....................
Name: L U D FERNANDO
Address: 110, NORRIS CANAL ROAD, COLOMBO-10.


Signed by Don Harold Stassen Jayawardene
for and on behalf of MILFORD HOLDINGS (PRIVATE) LIMITED
in the presence of:

Witnesses:
1. ....................
Name: C R JANSZ
Address: 833, SIRIMAVO BANDARANAIKE MAWATHA, COLOMBO-14.
2. ....................
Name: L U D FERNANDO
Address: 110, NORRIS CANAL ROAD, COLOMBO-10.

Signed by Don Harold Stassen Jayawardene
for and on behalf of GREENFIELD PACIFIC EM HOLDINGS LIMITED
in the presence of:

Witnesses:
1. ....................
Name: C R JANSZ
Address: 833, SIRIMAVO BANDARANAIKE MAWATHA, COLOMBO-14.
2. ....................
Name: L U D FERNANDO
Address: 110, NORRIS CANAL ROAD, COLOMBO-10.

හැටන් නැෂනල් බැංකුවේ කලමනාකාර අධ්‍යක්ෂ සහ ප්‍රධාන විධායක නිලධාරී රියන්සි විජේතිලක විසින්, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ එම කොටස් මිල දී ගැනීම සඳහා, මෙම සමාගම් සමූහයට මුදල් යෙදවීමට හැකි බව තහවුරු කරමින් ලිපි නිකුත් කර ඇත. ඒ අනුව බැංකුකරුවන් ගේ වගකීමක් හැටියට එම සමාගම් වල සැබෑ අයිතිකරුවන් කවුරුන්දැයි දැන සිටිය යුතුය. ! *එනම්:*


HATTON NATIONAL BANK LIMITED

RIENZIE T. WIJETILLEKE
MANAGING DIRECTOR & CHIEF EXECUTIVE

Friday, November 29, 2002.

The Managing Director
Distilleries Company of Sri Lanka Ltd
110 Norris Canal Road
Colombo 10

Dear Sir,

**LETTER CONFIRMING THE AVAILABILITY OF FUNDS TO THE CONSORTIUM COMPRISING DISTILLERIES COMPANY OF SRI LANKA LTD., AITKEN SPENCE & CO. LIMITED AND AITKEN SPENCE INSURANCE (PVT) LTD., FOR PURCHASE OF SHARES OF SRI LANKA INSURANCE CORPORATION**

This has reference to my previous letter dated 17th September 2002, and the proposal submitted and the discussions we had on the above.

We hereby confirm that the funds required to bridge the gap between the funds internally available and the bid price indicated to us, will be made available by us to the consortium.

**The funds loaned will be structured as follows :**

(a) Long Term Loan to the consortium members to finance the majority portion of the shares the consortium intends to retain with them in the long term.
(b) Loans for 2-3 year period for the value of the portion of the shares the consortium intends to divest to the public.

We are satisfied with the proposed repayment plan and also the collateral offered for this syndicated facility.


We will structure the above facilities for the consortium with the participation of other banks if required, and the funds will be made to the consortium to meet the timetable set by the PERC for the conclusion of the transaction. As indicated in my previous letter this Bank will be the lender for the portion of funds loaned to be within the guidelines set by the Central Bank of Sri Lanka.

Please contact the undersigned on Tel: 662701, 664701 if further information or clarification is required.

This letter is issued on the request of Distilleries Company of Sri Lanka Ltd., on behalf of the consortium bidding for shares of Sri Lanka Insurance Corporation.

Yours faithfully,

Level 21, HNB Towers, 479 T B Jayah Mawatha, Colombo 10, Sri Lanka.
Telephone: 662701, 664701, Fax: 662737, Email: rienziew@sri.lanka.net


HATTON NATIONAL BANK LIMITED

RIENZIE T. WIJETILLEKE
MANAGING DIRECTOR & CHIEF EXECUTIVE

Tuesday, September 17, 2002.

The Managing Director
Distilleries Company of Sri Lanka Ltd
No 110, Norris Canal Road
Colombo 10.

Dear Sir,

**LETTER OF INTENT FOR FINANCING FOR THE PURCHASE OF SHARES OF INSURANCE CORPORATION OF SRI LANKA LTD. (SLICL)**

As per the discussions we have had with your company, we write to confirm that our Bank will structure facilities as shown below and act as the lead banker, in case the bid for the above, by the consortium comprising of Distilleries Company of Sri Lanka Ltd., (DCSL), Aitken Spence Company Limited and Aitken Spence Insurance Ltd., is successful.

(a) A term loan repayable in five years to DCSL to finance the short fall in own funds to purchase the shares of SLICL, that DCSL intends to hold long term.

(b) A bridging loan to DCSL/the consortium repayable within a period of 2-3 years to be paid by disposing the part of the equity in excess of the long-term holding as envisaged by the consortium, in the Colombo Stock Exchange or transferring all or part of such excess shares to other passive equity partners.

Other terms and conditions for the above facilities to be negotiated. Hatton National Bank will act as the lead bank in syndicating the above loans and will participate in lending within the limits specified by the Central Bank of Sri Lanka.

Please contact the undersigned on Tel : 430908 if further information or clarification is required.

This letter is issued on the request of Distilleries Company of Sri Lanka Ltd.

Yours faithfully,

10, R. A. De Mel Mawatha, Colombo 3, Sri Lanka.
Telephone : 430908, 421885 Fax : (941) 446312 E-Mail : rienziew@sri.lanka.net http://www.hnb.net

ඉහත සඳහන් කල ගනුදෙනුව සැකසීමට කටයුතු කර ඇත්තේ, ශ්‍රී ලංකා රජයේ උපදේශකවරුන් ලෙස ක්‍රියා කල වරලත් ගණකාධිකාරීවරුන් වූ ප්‍රයිස්වෝටර්හවුස්කූපර්ස් සමාගමයි. ආර්ථික ප්‍රතිසංස්කරණ අමාත්‍ය මිලින්ද මොරගොඩ විසින් 2002.1.22 දින පත් කරනු ලැබූ පහත දක්වා ඇති මෙහෙයුම් කමිටුව මගින් ප්‍රයිස්වෝටර්හවුස්කූපර්ස් සමාගම තෝරා ගෙන තිබුණි. එනමුත් පුදුමාකාර ලෙස, එය එසේ සිදු කර ඇත්තේ, ආර්ථික ප්‍රතිසංස්කරණ අමාත්‍ය මිලින්ද මොරගොඩ විසින් පසුව 2002.2.28 දින ඉදිරිපත් කර තිබූ අමාත්‍ය මණ්ඩල සන්දේශයක් මත වන අතර, එම අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අනුමැතිය ලැබී තිබුණේ 2002.4.3 දිනැතිව සහ ඒ අනුව එම අනුමැතිය තහවුරු කර සන්නිවේදනය කර තිබුණේ 2002.4.18 දින වේ. - *එනම්:*

| | | |
|---|---|---|
| ක්‍රිෂාන්ත පෙරේරා මහතා | සභාපති, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | සභාපති |
| ආචාර්ය පී. බී. ජයසුන්දර | සභාපති, රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | සාමාජික |
| එම්. කන්දසාමි මහතා | කලමනාකරු, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | සාමාජික |
| දේව රොද්‍රිගු මහතා | හවුල්කරු, ප්‍රයිස්වෝටර්හවුස්කූපර්ස් | සාමාජික |
| කේ. කනගසභාපති මහතා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව | සාමාජික |
| මරිනා තාමරත්නම් මිය | විධායක උප සභාපති, මෙහෙයුම්, ඩීඑෆ්සීසී | සාමාජික |
| ආචාර්ය ජයන්ත ජයසූරිය | අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය | සාමාජික |
| රනිල් ජයමහ මිය | මහ බැංකු අධිපති සහායක, මහ බැංකුව | සාමාජික |
| අනිලා ද සොයිසා මිය | අධ්‍යක්ෂ රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | ලේකම් |

රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණකවරුන්, එනම්, වරලත් ගණකාධිකාරී, SJMS ඇසෝසියේට්ස් විසින් වරලත් ගණකාධිකාරී, ප්‍රයිස්වෝටර්හවුස්කූපර්ස්, එසේ තෝරාගත් ගනු ලැබීම තරයේ හෙලා දැක ඇත්තේ, එම සමාගමේ ජ්‍යෙෂ්ඨ හවුල්කරු එම මෙහෙයුම් කමිටුවේ සාමාජිකයෙකු ලෙස ක්‍රියා කිරීම මතය. - එනම්:

PUBLIC ENTERPRISES REFORM COMMISSION
INTERNAL AUDIT
FOR ONGOING & COMPLETED PRIVATISATION

**SJMS Associates**

**Chartered Accountants**
Colombo, Sri Lanka.

An Independent Correspondent Firm to **Deloitte Touche Tohmatsu**

**රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව**
**පාර්ලිමේන්තුවට ඉදිරිපත් කල වාර්තාව සඳහා අභ්‍යන්තර විගණන**

1.3.2 ප්‍රයිස්වෝටර්හවුස්කූපර්ස් (PWC) මූල්‍ය උපදේශක ලෙස තේරී ඇත. ප්‍රයිස්වෝටර්හවුස්කූපර්ස් (PWC) හි හවුල්කරුවකු වූ දේව රොද්‍රිගු මහතා, ප්‍රයිස්වෝටර්හවුස්කූපර්ස් (PWC) මූල්‍ය උපදේශක තෝරා ගනු ලැබූ මෙහෙයුම් කමිටුවේ එක් සාමාජිකයකු වන අතර, බැඳියා පිලිගැටුම සළකා නොමැත.

XXXXXXXXXXXXXXXXXXXXX

මෙම ගනුදෙනුව හසුරුවා තිබූ වරලත් ගණකාධිකාරී, ප්‍රයිස්වෝටර්හවුස්කූපර්ස්ගේ 'ප්‍රධාන කාර්ය මණ්ඩලය' ඔවුන්ගේම ලේඛන ගත කිරීම් වලට අනුව පහත සඳහන් වේ. මවිතයක් ලෙස, ඔවුන්ගේ ක්‍රියාදාමයේ ප්‍රගතිය සහ ඔවුනට ගෙවීම් අනුමත කිරීම සිදු කර තිබුණේ, එම ප්‍රයිස්වෝටර්හවුස්කූපර්ස් සමාගමේ ජ්‍යෙෂ්ඨ හවුල්කරුද ඉහත කී මෙහෙයුම් කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කරන අතරතුරය.!

Appendix C – Key Personnel and Sub-Consultants

| Name | Position | Estimated No of weeks |
|---|---|---|
| Investment Banking and Valuation | | |
| Roger de Montfort | Project Co-ordinator | 4 |
| Channa Manoharan | PwC Sri Lanka Tram Leader | 8 |
| Mark Speller | Head of Investment Banking | 4 |
| Kevin Reeves | Head of Business Valuation | 1 |
| Paul Reddel | Project Director | 12 |
| Faizan Rahan | Project Manager | 15 |
| Jayant Shah | Insurance Industry Expert | 4 |
| Steve Kasmun | Business Valuation Manager | 4 |
| Daya Weeraratne | Tax Advisor | 1 |
| Sriyani Perera | Sri Lanka Insurance & Accounting Expert | 2 |
| Dishna de Silva | Transaction support | 10 |
| Sujeewa Mudalige | Transaction support | 15 |
| | Sub total | 80 |
| Actuarial | | |
| Paul Nuttall | Head of Actuarial Valuation | 2 |
| Michael Playford | Support on Actuarial Life & General Valuation | 2 |
| Tony Leung | Support on Actuarial Life Valuation | 4 |
| | Sub total | 8 |
| Legal | | |
| Keith McGuire | Head of Legal Advisory Services | 16 |
| Philip Jarvis | Allen & Overy Senior Associate | 4 |
| Oo Ban Leong | Allen & Overy Senior Associate | 6 |
| Linda Lee | Allen & Overy Senior Associate | 16 |
| Paul Ratnayake | Team Leader – Sri Lanka Legal Adviser | 4 |
| Amali Alawwa | Manager – Sri Lanka Legal Adviser | 6 |
| Amrit Rajapakse | Associate – Sri Lanka Legal Adviser | 6 |
| | Sub total | 58 |

ඒ අනුව, මෙම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව පෞද්ගලීකරණය කිරීමේ ගනුදෙනුවට වරලත් ගණකාධිකාරී ප්‍රයිස්වෝටර්හවුස්කූපර්ස් සමාගමට ගෙවා ඇති සාර්ථකත්වයේ ගාස්තුද ඇතුලත් මූල්‍යාදායක ගාස්තු පහත දක්වා ඇත. එනමුත් එම පෞද්ගලීකරණ ගනුදෙනුව රටේ උත්තරීතරම අධිකරණය වන ශ්‍රේෂ්ඨාධිකරණය විසින්, එය වැරදි සහගත, නීතිය නොතකා සහ නීති විරෝධී ලෙස සිදු කර ඇති බවට තීන්දු කොට, අවලංගු කරන ලද අතර, ඒ අනුව එම ගාස්තු නැවත අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. - *එනම්:*

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය
விஞ்ஞான தொழில்நுட்பவியல் அமைச்சு
MINISTRY OF SCIENCE AND TECHNOLOGY
561/3, Elvitigala Mawatha, Colombo 05, Sri Lanka

Telephone 2554548 2510500 | Fax 2510565 2554343 | P. O. Box 1571
My No. | Your No. | Date 05.06.2006

Director Finance and Administration
PERC,
World Trade Centre,
Colombo - 01.

**Privatization of S/L Insurance Corporation Payment of Success Fee. to the Financial Advisors.**

Reference your letter dated 29 May 2006

This is to confirm that the amount of Rs.46,282,500/- was paid to the PT Pricewaterhouse Coopers FAS by the Ministry of Economic Reform Science and Technology on 05th May 2003 by wire transfer.
(BOC Travel and Remittance Dept. Ret No: TL/03/2708/05- US $ 475423/72)

Chief Accountant
For Secretary,
Ministry of Science and Technology.

**PUBLIC ENTERPRISES REFORM COMMISSION**

Sri Lanka Insurance corporation - Pricewaterhouse Coopers

| V/No | Discription | Paid Date | Amount (US$) | Amount (Rs) |
|---|---|---|---|---|
| I/08 | In/banking - 1st & 2nd | 29.08.02 | 179,177.53 | 17,311,407.00 |
| I/19 | In/banking - 3rd & 4th | 06.11.02 | 130,650.00 | 12,636,714.00 |
| I/20 | inland revenue - I/b | 08.11.02 | 16,180.39 | 1,564,643.71 |
| I/27 | In/banking - 5th pay | 16.12.02 | 43,550.00 | 4,220,785.00 |
| I/28 | inland revenue - I/b | 18.12.02 | 2,250.00 | 217,912.50 |
| I/42 | inland revenue - I/b | 19.03.03 | 1,637.35 | 158,986.68 |
| I/54 | inland revenue - I/b | 08.05.03 | 2,250.00 | 218,925.00 |
| I/56 | In/banking - 6th | 07.05.03 | 51,610.04 | 5,024,633.00 |
| I/60 | investment banking | 19.06.03 | 40,250.00 | 3,918,753.18 |
| | | | **467,555.31** | **45,272,760.07** |
| I/22 | acturial service - 1st & 2nd | 18.11.02 | 144,000.00 | 13,927,659.00 |
| I/23 | inland revenue - a/s | 22.11.02 | 7,500.00 | 725,250.00 |
| | | | **151,500.00** | **14,652,909.00** |
| I/40 | inland revenue - Legal | 07.03.03 | 12,283.10 | 1,192,689.01 |
| I/41a | legal fee 1st & 2nd | 06.03.03 | 243,838.25 | 23,679,667.00 |
| I/41c | legal fee 1st & 2nd -jason | 17.03.03 | 31,838.40 | 3,094,481.00 |
| I/44b | legal fee - 3rd | 03.04.03 | 21,099.88 | 2,051,771.00 |
| I/45 | legal fee - 4th | 09.04.03 | 52,889.35 | 5,138,528.00 |
| I/47 | inland revenue - legal | 17.04.03 | 3,776.02 | 366,651.54 |
| I/51 | legal fee - 5th | 29.04.03 | 73,138.50 | 7,108,379.00 |
| I/52 | inland revenue - legal | 30.04.03 | 3,761.45 | 365,424.86 |
| I/61 | legal fee - 6th | 02.07.03 | 35,841.50 | 3,488,561.00 |
| | | | **478,466.45** | **46,486,152.41** |
| I/17 | reimbursable | 15.10.02 | 9,211.39 | 891,293.00 |
| I/33b | reimbursable | 02.01.03 | 16,392.10 | 1,591,363.00 |
| I/41b | reimbursable | 17.03.03 | 1,488.00 | 147,457.00 |
| I/46 | reimbursable | 10.04.03 | 3,870.42 | 378,790.00 |
| I/59 | reimbursable | 28.05.03 | 1,848.94 | 182,972.00 |
| I/60 | reimbursable | 19.06.03 | 9,092.86 | 885,283.82 |
| I/65 | reimbursable | 06.10.03 | 555.00 | 55,598.00 |
| | | | **42,458.71** | **4,132,756.82** |
| I/30 | reimb.of PERC expenses | 09.01.03 | - | **274,165.00** |
| | | | ***1,139,980.47*** | ***110,818,743.30*** |

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ 90% කොටස් විකිණීමට ලංසු සඳහා මිල ගණන් ඇගයීමේ පරමාර්ථයෙන් කටයුතු කල වරලත් ගණකාධිකාරී ප්‍රයිස්වෝටර්හවුස්කූපර්ස් විසින් ප්‍රශ්නකාරී අන්දමින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව තක්සේරු කර තිබුණේ, සුළු මිලකට, එනම් රු. මිලියන 5,100 සිට රු. මි. 5,400 ක වටිනාකමකටය.

**INDICATIVE VALUATION**
**AS AT 31 DECEMBER 2001**

SRI LANKA INSURANCE CORPORATION LIMITED

Strictly Private and Confidential
November 2002

PERC
Public Enterprises Reform Commission

Financial Adviser:

PRICEWATERHOUSECOOPERS

එනමුත් කර්තෘ එහි වගඋත්තරකරුවෙකු ලෙස සහ එකල රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සභාපති ලෙස, ඉහත කී තක්සේරුව අභියෝගයට ලක්කරමින් කර්තෘ විසින් ගණනය කොට ආදර්ශනය කර ඉදිරිපත් කරමින් හුවා දක්වා ඇත්තේ, එහි නිවැරදි තක්සේරුව රු. මිලියන 34,000 කට වඩා අධික විය යුතු බවත්ය. ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවෙන් කර්තෘගේ එම තක්සේරුව ශ්‍රේෂ්ඨාධිකරණය පිලිගත් බව එළිදරව් වන්නේය.

2003.4.11 දින විකිණීම සහ මිලදී ගැනීමේ ගිවිසුම අත්සන් කර තිබුණේ, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ විගණකවරුන් වන අර්නස්ට් සහ යන්ග් සමාගම විසින් 2002.3.31 දිනට ප්‍රශ්නකාරී ලෙස සකස් කල 'කළමනාකරණ ගිණුම්' මතය. සෘජුවම එම ගිණුම් 'විගණනය නොකල' ගිණුම් බව ප්‍රකාශ කර තිබුණි.

එම නිසා, ඉහත කී කොටස් විකිණීම 2003.4.11 දින සිදු වූ බැවින්, විකිණීම සහ මිලදී ගැනීමේ ගිවිසුමේ එක් කොන්දේසියක් වූයේ, එම විකුණුම් මුළු මුදල සැලකීම වූ රු. මිලියන 6050/-, 2002.3.31 සහ 2003.4.11 යන දින දෙක අතර, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ශුද්ධ කාරක ප්‍රාග්ධනය වැඩිවීමෙන් හෝ අඩුවීමෙන් එම විකුණුම් මිල වැඩිවිම හෝ අඩුවිම සිදුවිය යුතු බවය. ශුද්ධ කාරක ප්‍රාග්ධනය වශයෙන් අර්ථ දක්වා ඇත්තේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ජංගම වත්කම් සහ ජංගම වගකීම් අතර පරතරයයි.

මෙය විශ්මජනක වන්නේ, එම අවස්ථාවේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ 2001.3.31 දිනට ගිණුම්, වරලත් ගණකාධිකාරි, අර්නස්ට් ඇන්ඩ් යංග්, විසින්ම සහතික කර තිබූ විගණන ගිණුම් ලෙස තිබීමත්, පැහැදිලි ලෙස ජංගම වත්කම් හා ජංගම වගකීම් වෙන වෙනම පෙන්වා දී තිබීමත් නොසලකා; ඉහත කී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ කොටස් විකිණීමට ඉහත කී 2002.3.31 දිනට විගණනය නොකල 'කළමනාකරණ ගිණුම්' වල එම ජංගම වත්කම් හා ජංගම වගකීම් වෙන වෙනම ප්‍රශ්නකාරී ලෙස නොපෙන්වා තිබීමය. එය එසේ සිදු කර තිබුණේ, ඉහත කී කොන්දේසියට අනුව ඉහත කොටස් විකිණීමේ මුළු මුදල සැළකීම රු. මිලියන 6050, ඉහත ප්‍රකාර අඩු වැඩි කිරීමට ඒවා එළිදරව් කිරීම අත්‍යවශ්‍ය කරුණක්ව තිබියදීය.

විකිණීම සහ මිලදී ගැනීමේ ගිවිසුමේ ඉහත කී කොන්දේසිය අනුව, කොටස් විකිණීමේ මුළු මුදල රු. මිලියන 6050 වැඩි කිරීම හෝ අඩු කිරීම ගණනය කොට, 2003.4.11 දින, එනම් කොටස් විකුණූ දින සිට දින 60 ක් ඇතුලත වරලත් ගණකාධිකාරි, අර්නස්ට් ඇන්ඩ් යංග්, එය සැකසීමට බැඳී සිටියද, නමුත් එම ගණනය කිරීමට වරලත් ගණකාධිකාරි, අර්නස්ට් ඇන්ඩ් යංග්, එය නිම කිරීමට කල් මරමින් 16 වතාවක් දින දීර්ඝ කර ගැනීමට කටයුතු කර තිබුනත්, මෙම නඩුව ගොනු කරන දින තෙක්, ඔවුන් විසින් මෙම කර්තව්‍යය අවසන් කර නොතිබුණි.


| | | | |
|---|---|---|---|
| 1) | 9.6.2003 | 9) | 19.5.2004 |
| 2) | 7.8.2003 | 10) | 28.5.2004 |
| 3) | 10.10.2003 | 11 ) | 15.6.2004 |
| 4) | 11.11.2003 | 12) | 19.7.2004 |
| 5) | 12.12.2003 | l3) | 16.8.2004 |
| 6) | 20.1.2004 | 14) | 30.8.2004 |
| 7) | 30.1.2004 | 15) | 15.9.2004 |
| 8) | 26.3.2004 | 16) | 15.10.2004 |

වරලත් ගණකාධිකාරි, අර්නස්ට් ඇන්ඩ් යංග් විසින් ඉහත කී ප්‍රකාර ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ 2003.4.11 දිනට විගණනය නොකල 'කළමනාකරණ ගිණුම්' සකසා තිබුණි. එසේ සිදු කර තිබුණේ ජංගම වත්කම් සහ ජංගම වගකීම් ප්‍රශ්නකාරී ලෙස වෙන වෙනම පෙන්නා නොතිබීමෙනි. නමුත් ඉහත කී කොටස් විකිණීමේ මුළු මුදල වූ රු. මිලියන 6050 ඉහත කොන්දේසිය අනුව අඩු වැඩි කිරීමට, එසේ වත්කම් සහ වගකීම් වෙන් කර දැක්වීම අත්‍යවශ්‍ය කරුණක් විය.

එනමුත් උපහාසාත්මක ලෙස, වරලත් ගණකාධිකාරි, අර්නස්ට් ඇන්ඩ් යංග් විසින්, 2001.12.31 දින ගිණුම් වල එළිදරව් කර තිබූ විගණන ගිණුම් ආකාරයටම, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ 2002.12.31 දිනට විගණනය කල ගිණුම් අනුව, ජංගම වත්කම් සහ ජංගම වගකීම් වෙන් වෙන් වශයෙන් පැහැදිලි ලෙස පෙන්වා දී තිබුණි.

මේ පිළිබඳ රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබූ විමර්ශනයකදී එළිදරව් කර ගෙන තිබුණේ, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ 2002.12.31 දිනට විගණන ගිණුම් වල පෙර වර්ෂයේ එනම් 2001.12.31 දිනට ස්ථාවර වත්කම් හා ජංගම වත්කම්, අතීතයට බලපාන සේ රහසිගතව වෙන් කර සකස් කර ඇති බවය. එම වෙනස සසඳා බැලීමේදී සැලකිය යුතු වෙනසක් වූ රු. මිලියන 3000 ක් වෙනස ලෙස අනාවරණය කර ගෙන තිබුණි. !

මෙම සිදුවීම් දීන වකවානු අනුව පහත දක්වා ඇති ප්‍රස්ථාරයෙන් පෙන්නුම් කර ඇත:




ඉහත කී අතීතයට බලපාන රහසිගතව කරන ලද වෙනස්කම් වල ප්‍රතිඵලයක් ලෙස, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ශුද්ධ කාරක ප්‍රාග්ධන මට්ටම බැලූ බැල්මට ඉහත කී දින දෙක අතර අඩුවීමක් පිළිඹිබු වේ. එනමුත් එය වරලත් ගණකාධිකාරි අර්නස්ට් ඇන්ඩ් යංග් විසින් සහතික නොකරන ලදුව, පසුව ශ්‍රී ලංකා ඩිස්ටිලරීස් සමාගම විසින් ශ්‍රී ලංකා රජයෙන් ඉහත කී විකුණුම් මුදලෙන් රු. මිලියන 2,059,436,000 / - ක් 15% පොලීයත් සමග ආපසු අයකර ගැනීමට, පහත සදහන් පරිදි ඒ මත එන්තරවාසියක් එවා තිබුණි - *එනම්:*

04912

**Sudath Perera**
Associates

51, KASSAPA ROAD,
COLOMBO 5, SRI LANKA.
Tel: 94 11 2559944-7 Fax: 94 11 2559948
E-mail: spalegal@sltnet.lk

13 JAN 2005
Office Of The Secretary To The Treasury & Secretary Ministry Of Finance

ST
12 JAN 2005
205

17 JAN 2005

**REGISTERED POST/BY COURIER**

11th January 2005

Our ref : SPA-G-990

The Secretary to the Treasury
On behalf of the Government of Democratic Socialist Republic of Sri Lanka
The Secretariat
Colombo.

Dear Sir,

**<u>"Adjustment of Consideration" – vis-a-vis Sri Lanka Insurance Corporation Ltd. (SLIC) as per Clause 4A of the agreement dated 11th April 2003.</u>**

XXXXXXXXXXXXXXXXXXXXXXXX

In the circumstances we are instructed to demand from you and we are hereby demand the immediate payment of the said sum of Rs. 2,059,436,000/= with 15% interest per annum until the full payment is made.

We are further instructed to inform you that should you fail to pay the said sum within 30 days of the date hereof our Client's have instructed us to initiate legal proceedings to recover the said sum together with interest.

Yours faithfully

Sudath Perera Assoc.

cc. Hon. Attorney General – Attorney Generals Department, Colombo 12.

Chairman, Public Enterprises Reform Commission – 11-01, West Tower, World Trade Centre, Echelon Square, Colombo1

එයට පිළිතුරු වශයෙන්, ගරු නීතිපතිතුමා පහත දැක්වෙන 2005.4.11 දිනැති ලිපියෙන් දැනුම් දී තිබූ පරිදි, ශ්‍රී ලංකා ඩිස්ටිලරීස් සමාගමේ ඉහත කී එම වංචනික ඉල්ලීම තරයේ ප්‍රතික්ෂේප කොට, සහ ඔවුන්ගේ සමාගම් සමූහයට එරෙහිව නීතිමය පියවර ගන්නා බවට නොතිසි නිකුත් කර තිබුණි.

My No. CA/144/05/PERC
Your No.
Telephone Nos. 2433967, 2433769, 2320800, 2327919
E-mail attorney @ sri.lanka.net, counsel @ sri.lanka.net
Fax 2436421

නීතිපති දෙපාර්තමේන්තුව
சட்டமா அதிபதி திணைக்களம்
ATTORNEY-GENERAL'S DEPARTMENT

P. O. Box No. 502
කොළඹ 12
கொழும்பு 12
Colombo 12.

11th April 2005

" ඩී. එච්. එස්. ජයවර්ධන මහතා
කලමනාකාර අධ්‍යක්ෂ
ශ්‍රී ලංකා ඩිස්ටිලර්ස් සමාගම
අංක 110, නොරිස් කැනැල් පාර
කොළඹ 10

හිතවත් මහත්මයාණනි,

**2003 අප්‍රේල් 11 දිනැති ගිවිසුමෙහි 4 වන වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව (SLIC) අනොයානය වශයෙන් "සලකා බැලීමේ ගැලපුම්."**

XXXXXXXXXXXXXXXXX

තවද, එකී ගැනුම්කරුවන්හට තවදුරටත් දැනුම් දීමකින් තොරව, එම ගැනුම්කාර ව්‍යාපාර සමූහයේ නිශ්චිත ක්‍රියාකාරීත්වයන් තහවුරු කර ගැනීම සඳහා, එනම් නම් වශයෙන් ගත් කල, කොළඹ 10, නොරිස් කැනැල් පාර, අංක 110 හි මිල්ෆෝඩ් හෝල්ඩිංග්ස් (පෞද්ගලික) සමාගම, සිංගප්පූරුවේ, ක්ලබ් ස්ට්‍රීට්හි, අංක 61 හි පිහිටි ඒෂියා බොක්ස් කන්සල්ටන්ස් සර්විසස් (පෞද්ගලික) සමාගම බාරේ, ජිබ්‍රෝල්ටාහි ග්‍රීන් ෆීල්ඩ් පැසිෆික් ඊඑම් හෝල්ඩිංග්ස් සමාගම සහ / හෝ ඇපකරුවන් වන ශ්‍රී ලංකා ඩිස්ටිලර්ස් කම්පැනි සමාගම, ඒට්කන් ස්පෙන්ස් සහ සමාගම සහ ඒට්කන් ස්පෙන්ස් ඉන්ෂුවරන්ස් (පෞද්ගලීක) සමාගමට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ගයන් ස්ථාපිත කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් මා වෙත උපදෙස් ලැබී ඇත.

ඔබේ හිතවත්,

(අත්සන)

ගරු නීතිපති "

එම අවස්ථාවේදීම, ගරු නීතිපතිතුමා එදිනම පහත දැක්වෙන 2005.4.11 දිනැති ලිපි මගින් ප්‍රයිස්වෝටර්හවුස්කූපර්ස් සහ අර්නස්ට් ඇන්ඩ් යන්ග් සමාගම් වලට දැනුම් දී තිබුණේ, ඔවුන්ගේ නොසැලකිලිමත් ක්‍රියා මත සහ / හෝ සිතාමතා කල වැරදි ක්‍රියාවන් මත ශ්‍රී ලංකා රජයට අත් වූ අලාභය අයකර ගැනීමට ඔවුන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බවය. - *එනම් :*

මගේ අංකය / எனது இல. / My No. CA/144/05/PERC
ඔබේ අංකය / உமது இல. / Your No.
දුරකථන අංක / தொலைபேசி இல. / Telephone Nos. 2433967, 2433769, 2320800, 2327919
ඉලෙක්ට්‍රොනික් තැපැල් / மின்-அஞ்சல் / E-mail attorney @ sri.lanka.net, counsel @ sri.lanka.net
ෆැක්ස් / பெக்ஸ் / Fax 2436421

නීතිපති දෙපාර්තමේන්තුව
சட்டமா அதிபதி திணைக்களம்
ATTORNEY-GENERAL'S DEPARTMENT

තැ. පෙ. අංකය / அஞ்சல் பெட்டி / P. O. Box No. 502
කොළඹ 12
கொழும்பு 12
Colombo 12.

11th April 2005

"ප්‍රයිස්වෝටර්හවුස්කූපර්ස්, එෆ්ඒඑස්
ජේඅයි, ජේආර් රසූනා සේඩ් කැව් 3,
කුයිංගන්, ජකර්තා 12920
ඉන්දුනීසියා

ප්‍රයිස්වෝටර්හවුස්කූපර්ස්
වරලත් ගණකාධිකාරි
100, බේබෘක් පෙදෙස
කොළඹ 2.

හිතවත් මහත්වරුණි,


**2003 අප්‍රේල් 11 දිනැති ගිවිසුමෙහි 4 වන වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව (SLIC) අන්‍යොන්‍ය වශයෙන් "සලකා බැලීමේ ගැලපුම්."**

xxxxxxxxxxxxxxxxxx

මම 2005.2.9 දිනැති අපගේ ලිපියෙහි අන්තර්ගතය නැවත අවධාරණය කරන අතර, ඔබ වගකිව යුතු සහ යටත් බව සඳහන් කරමි. තවද, මම ඔබේ නොසැලකිලිමත් ක්‍රියාවන් සහ / හෝ සිතාමතා සිදු කරනු ලැබූ විෂමාචාරය හේතුවෙන්, ශ්‍රී ලංකා රජය විසින් අත්විඳින හානි

ප්‍රකෘතිමත් කිරීම සඳහා නීතිමය පියවර ගන්නා ලෙසට, ශ්‍රී ලංකා රජය විසින් මා වෙත උපදෙස් ලබා දී ඇත.

ඔබේ හිතවත්,



ගරු නීතිපති “

මගේ අංකය / எனது இல. / My No. CA/144/05/PERC

ඔබේ අංකය / உமது இல. / Your No.

දුරකථන අංක / தொலைபேசி இல. / Telephone Nos. 2433967, 2433769, 2320800, 2327919

ඉලෙක්ට්‍රොනික් තැපැල් / மின்-அஞ்சல் / E-mail attorney @ sri.lanka.net, counsel @ sri.lanka.net

ෆැක්ස් / பெக்ஸ் / Fax 2436421

නීතිපති දෙපාර්තමේන්තුව
சட்டமா அதிபதி திணைக்களம்
ATTORNEY-GENERAL'S DEPARTMENT

තැ. පෙ. අංකය / அஞ்சல் பெட்டி / P. O. Box No. 502

කොළඹ 12
கொழும்பு 12
Colombo 12.

11th April 2005

අර්නස්ට් ඇන්ඩ් යංග්
වරලත් ගණකාධිකාරි,
201, ද සේරම් පෙදෙස,
කොළඹ 10.


හිතවත් මහත්වරුණි,

**2003 අප්‍රේල් 11 දිනැති ගිවිසුමෙහි 4 වන වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව (SLIC) අන්‍යොන්‍ය වශයෙන් "සලකා බැලීමේ ගැලපුම්."**

XXXXXXXXXXXXXXXXXX


මේ තත්වයන් මත, ඔබට තවදුරටත් දැනුම් දීමකින් තොරව, ඔබගේ වැරදි සහගත හැසිරීම සළකා ශ්‍රී ලංකා රජය වෙත සිදුවූ හානි වෙනුවෙන් සහ ඔබගේ නිශ්චිත ක්‍රියාකාරීත්වයන් වෙනුවෙන් ඔබට එරෙහිව නිතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව, ඔබ වෙත දන්වන ලෙසට ශ්‍රී ලංකා රජය විසින් මා වෙත උපදෙස් ලබා දී ඇත.

ඔබේ හිතවත්,



ගරු නීතිපති “

කෙසේ වෙතත්, එවකට භාණ්ඩාගාරයේ ලේකම් පී. බී. ජයසුන්දර විසින් ඉහත කී පරිදි නීතිමය පියවර ගෙන කටයුතු කිරීමට උපදෙස් ලබාදී තිබුණේ නැත. මක් නිසාද යත්, පී. බී. ජයසුන්දර ද ඉහත කී නින්දිත පෞද්ගලීකරණ ගනුදෙනුව සඳහා පාර්ශවකරුවෙක් වූ බැවින් සහ ඔහු උපදේශකයෙකු වශයෙන් අන්‍යොන්‍යව, අර්නස්ට් ඇන්ඩ් යන්ග් සමාගම සමඟ බරපතල පිලිගැටුමක් සිදු කරගෙන තිබුණු බැවින් යයි අනුමාන කෙරේ. - *එනම්:*



THE SUNDAY TIMES INTERNATIONAL
Sunday October 1,2006

NEWS | 3

The Chartered Institute of Marketing
Sri Lanka Region

CIM TALKING POINT

POWERED BY
HSBC
The world's local bank

**Versatility of Sri Lanka's Economy**
***Implications to the Business and Marketing Fraternity***

The Marketer of today needs to be more diverse than ever before. He needs to come to grips with the complexities and challenges that make up the external business and organizational environments.

As a marketer this is your opportunity to get an in-depth insight into the world of economics and its pivotal role in today's marketing context. The island's leading policy maker and economist will show you how to master key economic aspects with an overview of institutions - including the NCED & Ministry of Finance - which help define Sri Lanka's economic policy and plans.

**Keynote Speaker: Dr. P B Jayasundera**

Dr. P B Jayasundera

Dr. P B Jayasundera is Secretary to the Treasury, Secretary to the Ministry of Finance and Planning and Chairman, National Council for Economic Development (NCED). He has also served as the Development Officer at the Industrial Development Board and as Additional Director at the Central Bank of Sri Lanka and to date counts 28 years in the administrative service.

He was also Chairman, Public Enterprises Reform Commission, Senior Policy Advisor, Ernst & Young and Consultant to the IMF and the World Bank on country assignments.

He has presented several publications and studies to institutions both local and overseas including the World Bank, IMF and OECF in Tokyo.

Date : 02nd October 2006
Time : 5.00 pm
Venue : Ceylon Continental "Moonstone Ballroom"

*For reservations call/fax The CIM Sri Lanka Regional Office on 2564860-1/4720298*

PRINCIPAL SPONSOR
SINGER AT HOME WORLDWIDE
DIRECT
LMD
GRAPHTEC (PVT) LTD.

*Driving a decade of change in Sri Lanka's business landscape*

ඓතිහාසික ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුව 2009.6.4 දින ප්‍රකාශයට පත් කරන ලද අතර, එම තීන්දුවේදී ජාත්‍යන්තර අධිකරණයේ ඩැනියුබ් නඩුව උපුටා දක්වමින්, විනිසුරු වීරමන්ත්‍රීගේ මතය මහාවංසයේ ධර්ම දේශනයක් හුවා දක්වමින් ඉදිරිපත් කර තිබුණේ, මහින්ද මහරහතන් වහන්සේ විසින් දේවානම්පියතිස්ස රජුට කල අවවාදයයි. එනම් "*රාජ්‍ය සම්පත් පාලකයාගේ භාරකාරත්වයේ තිබෙන බවත්, එය ශ්‍රී ලංකා නීති උරුමයේ කොටසක් ලෙස ජනතාවට අයිති වන බවත්ය ........*".

ශ්‍රේෂ්ඨාධිකරණය විසින්, එම පෞද්ගලීකරණ ගනුදෙනුව අවලංගු කොට, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව නැවත ශ්‍රී ලංකා රජය සතු කරන ලදී. ඒ සමගම සමස්ථ අධ්‍යක්ෂ මණ්ඩලය වහාම ඉවත් කොට, ශ්‍රේෂ්ඨාධිකරණයේ අනුමැතිය ඇතිව, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කරන ලෙසටත් සහ වරලත් ගණකාධිකාරී අර්නස්ට් ඇන්ඩ් යන්ග්, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ විගණනකරුවන් වශයෙන් කටයුතු කිරීමෙන් වහාම ඉවත් කරන ලෙසටත් තීන්දු කරන ලදී.

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව, පහත දක්වා ඇති පුද්ගලයන් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ අධ්‍යක්ෂකවරුන් ලෙස අදාල කාලය තුල කටයුතු කර ඇත.

| අධ්‍යක්ෂ | 2003 | 2004 | 2005 | 2006 | 2007 | 2008 | 2009 |
|---|---|---|---|---|---|---|---|
| ඩී. එච්. එස්. ජයවර්ධන<br>අංක 82, ප්‍රධාන පාර,<br>ජා ඇල | * | * | * | * | * | * | * |
| ආර්. කේ. ඔබේසේකර<br>අංක 284, නාවල පාර,<br>කොළඹ 3. | * | * | * | * | * | * | * |
| ජී. කේ. දයාසිරි<br>අංක. 21, බගතලේ පාර,<br>කොළඹ 3. | * | * | * | | | | |
| ජේ. එම්. එස්. බ්‍රිටෝ<br>අංක. 67, වෝඩ් පෙදෙස,<br>කොළඹ 7. | * | * | * | * | | | |
| සී. ආර්. ජන්ස්<br>අංක. 34ඒ, ලුම්බිණි මාවත,<br>රත්මලාන. | * | * | * | * | * | * | * |
| එල්. යූ. ඩී. ප්‍රනාන්දු<br>අංක. 407/23, පරණ<br>කොට්ටාව පාර,<br>නුගේගොඩ | * | * | * | * | * | * | * |
| එච්. වික්‍රමසිංහ<br>අංක. 15/3, බාන්ස් පෙදෙස,<br>කොළඹ 7. | | | | | * | * | * |
| සී. මුත්තුකුමාරු<br>අංක. 32/18, බාන්ස්<br>පෙදෙස, කොළඹ 7. | | | | | * | * | * |
| ඒ. එස්. අබේවර්ධන<br>අංක. 16, කේම්බ්‍රිජ් පෙදෙස,<br>කොළඹ 7. | | | | | * | * | * |

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය, එහි සාමාජිකයන් වන වරලත් ගණකාධිකාරී ප්‍රයිස්වෝටර්හවුස්කූපර්ස් සහ අර්නස්ට් ඇන්ඩ් යන්ග්ගේ හැසිරීම හා ක්‍රියා පිළිවෙල සම්බන්ධයෙන් පරීක්ෂණ සිදු කිරීමට ආරම්භ කර තිබුණේ, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සභාපති එම නඩුවේ පාර්ශවකරුවෙකු ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කල දිවුරුම් ප්‍රකාශයක් අනුවය. එනමුත් එම විමර්ශන මන්දගාමීව දිග්ගස්සමින් සහ උඩු යටිකුරු කරමින් සිදු කෙරුණු අතර, කිසිවෙකුට එරෙහිව දඬුවම් පැමිණවීමට කටයුතු නොකෙරුණි. එමගින් මහජනයා වෙත වරලත් ගණකාධිකාරී වෘත්තීයේ වෘත්තීය වගවීම සහ භාරකාරත්වය විහිලුවක් බවට ලක් කිරීමක් සිදු විය.

ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයද මහා ආන්දෝලනයකින් යුතුව කටයුතු කරමින්, ව්‍යාපාරික ආචාර ධර්ම සහ හැසිරීම සහ යහපාලනය පිළිබද ප්‍රකාශන පලකර සිටියත්, ඔවුන්ද ඉහත කී මහා පරිමාණ වංචාව පිළිබඳවකිසිදු ක්‍රියා මාර්ගයක් නොගැනීමෙන් සහ ඒ ගැන අවධානය යොමු නොකර ඊට ආනුෂංගිකව කටයුතු කිරීමෙන්, ඔවුන්ගේ දෙබිඩි පිළිවෙතද මනාසේ හෙළිදරව් වේ.

එසේ තිබියදී, ලැයිස්තු ගත පොදු සමාගම් මැදිහත් වී සිදු කල ක්‍රියාවන් පිළිබඳ අන්‍යොන්‍ය වශයෙන්, අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, ඇතුළු පොලිස්පති, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා සුරැකුම් හා විනිමය කොමිෂන් සභාව වෙත පැමිණිලි ඉදිරිපත් කර තිබූ නමුත්, මේවා හසුරුවන සහ නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් විසින් මෙම මහා පරිමාණ මහජන දේපල වංචා කිරීම පිළිබඳව කටයුතු නොකරන පුදුම සහගත ලෙස ප්‍රශ්නකාරී නිහඬ පිළිවෙතක් අනුගමනය කිරිමෙන්, නීතියේ ආධිපත්‍යය හුදු විහිළුවක් ලෙස ගෙන ක්‍රියා කිරීමට කටයුතු කර තිබුණි.

ඉහත සඳහන් කරුණු මත වරදවල් වලට එරෙහි 1982අංක 12 දරණ මහජන දේපල පනත අනුව වහාම පහත පියවර ගත යුතුව තිබුණි -

1. මහජන දේපල වලට අලාභ කිරීම
2. මහජන දේපල සොරකම් කිරීම
3. මහජන දේපල මංකොල්ල කෑම
4. මහජන දේපල මත අනිසි ලෙස හා විශ්වාසය කඩ කිරීම
5. මහජන දේපලමත වංචා, කූට ලේඛන සැකසීම, හෝ විකෘත කිරීම
6. ඉහත ඕනෑම වරදක්කිරීමට උත්සාහ ගැනීම

එනමුත් ඉහතකී ප්‍රකාර කිසිදු අයුරකින් කිසිම පියවරක් නොගන්නා ලදී. !

මෙම ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව ප්‍රකාශයට පත් වූ විගසම, ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් මෙම නඩුවේදී තරයේ විවේචනයට ලක්ව සිටි හිටපු ආර්ථික ප්‍රතිසංස්කරණ අමාත්‍ය මිලින්ද මොරගොඩ වහාම අධිකරණ අමාත්‍යවරයා ලෙස පත් කිරීමෙන්, ශ්‍රී ලංකාවේ ඉහලම අධිකරණය වූ ශ්‍රේෂ්ඨාධිකරණය හැල්ලුවට ලක් කරනු ලැබීය. ඊට අමතරව ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින්, නැවත පී. බී. ජයසුන්දර මුදල් අමාත්‍යංශයේ හා භාණ්ඩාගාරයේ ලේකම් ලෙස පත් කරනු ලැබීය. තවද හැරී ජයවර්ධන ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපති ලෙසත්, සුසන්ත රත්නායක (සභාපති, ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් සමාගම - කොළඹ වරායේ ඉන්ධන සපයන ඒකාධිකාරි තෙල් ටැංකි සමාගමේ පෞද්ගලීකරණයට ශ්‍රේෂ්ඨාධිකරණය

විසින්, වැරදි සහගත, නීතිය නොතකා, නීතිවිරෝධී සහ වංචානික ලෙස සිදු කර ඇති බවට තීන්දු  කොට, අවලංගු කිරීම) ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සභාපති ලෙසත් පත් කිරීම යහපාලනය සහ නීතියේ ආධිපත්‍යය විහිළුවක් බවට අවතක්සේරු කරනු ලැබීය. !

ගරු නීතිපතිතුමාගේ සහ අනෙකුත් නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් විසින්  ඉහත කී මහා පරිමාණ ජාතික ආර්ථික අපරාධය ගැන නොසැලකිලිමත්ව කටයුතු කරමින් සහ එයට සම්පූර්ණයෙන්ම වෙනස් ආකාරයකට  කටයුතු කරමින්, 2010 ජනවාරි මස ජනාධිපතිවරණයේ දී, ජනාධිපති මහින්ද රාජපක්ෂ සමග තරඟ කල හිටපු ජනරාල් සරත් ෆොන්සේකාට එරෙහිව පහත සඳහන් පරිදි චෝදනා 4 ක් ඇතුලත් කරමින්, චෝදනා පත්‍ර දෙකක් සකස් කර, 2010 මාර්තු මාසයේදී, 'රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ' අනුගමනය නොකිරීම සහ බැඳියා පිලිගැටුම මත ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින්ම ස්ථාපිත කල 2 වන යුද අධිකරණයෙන් එය විමසිමට කටයුතු කරනු ලැබීය.

**CHARGE SHEET – No. I**

The Accused O/50536 General GSC Fonseka RWP RSP VSV USP rcds psc is charged with:

| | |
|---|---|
| **1ST CHARGE**<br>Sec 109 (e)of the Army Act | **DISGRACEFUL CONDUCT**<br>In that you O/50536 General GSC Fonseka being an officer of the Regular Force of the Sri Lanka Army whilst on active service being the Commander of the Sri Lanka Army served as Chairman of the Tender Board pertaining to the procurement of Day Vision Binoculars (234 Nos) under reference No.  2.14.1 -788 from M/S British Borneo Defence - Australia through M/S Hicorp (Pvt) Ltd., and awarded the tender to the British Borneo Defence - Australia through M/S Hicorp (Pvt) Ltd., on or about 6th day of November 2007 in the knowledge of the fact that your son-in-law Danuna Thilakaratne had an interest or concern with the M/S Hicorp (Pvt) Ltd., aforesaid which relationship if disclosed, would have required you to disassociate yourself from the tender process in accordance with paragraph 1:4:2 and 1:4:3 of the Procurement Guidelines of 2006, and that you concealed the said relationship up to the date of your retirement on the 14th November 2009 and thereby you did commit a fraudulent act punishable under Section 109 of the Army Act No. 17 of 1949 (Chapter 357) of the Legislative Enactments of Sri Lanka (Ceylon) |
| **2ND CHARGE**<br>Sec 109 (e)of the Army Act | **DISGRACEFUL CONDUCT**<br><br>In that you O/50536 General GSC Fonseka being an officer of the Regular Force of the Sri Lanka Army whilst on active service being the Commander of the Sri Lanka Army served as Chairman of the Tender Board pertaining to the procurement of 12V Maintenance Free Batteries (50 Nos) under reference No.  2.14.1 -510 from M/S British Borneo Defence - Australia through M/S Hicorp (Pvt) Ltd., and awarded the tender to the British Borneo Defence - Australia through M/S Hicorp (Pvt) Ltd., on or about 23rd day of August 2007 in the knowledge of the fact that your son-in-law Danuna Thilakaratne had an interest or concern with the M/S Hicorp (Pvt) Ltd., aforesaid which |

| | |
|---|---|
| | relationship if disclosed, would have required you to disassociate yourself from the tender process in accordance with paragraph 1:4:2 and 1:4:3 of the Procurement Guidelines of 2006, and that you concealed the said relationship up to the date of your retirement on the 14th November 2009 and thereby you did commit a fraudulent act punishable under Section 109 of the Army Act No. 17 of 1949 (Chapter 357) of the Legislative Enactments of Sri Lanka (Ceylon) |
| 24th March 2010 | To be remanded for trial by General Court Martial<br><br>J. JAYASURIYA USP ndu psc<br>Lieutenant General<br>Commander of the Army |
| 31stMarch 2010 | To be tried by General Court Martial<br><br>MAHINDA RAJAPAKSA<br>President of the Democratic Socialist Republic of Sri Lanka |

**CHARGE SHEET – No. II**

The Accused O/50536 General GSC Fonseka RWP RSP VSV USP rcds psc is charged with:

| | |
|---|---|
| **1ST CHARGE**<br>Sec 109 (e)of the Army Act | **DISGRACEFUL CONDUCT**<br><br>In that you O/50536 General GSC Fonseka being an officer of the Regular Force of the Sri Lanka Army whilst on active service being the Commander of the Sri Lanka Army served as Chairman of the Tender Board pertaining to the procurement of 5KVA Generators (50 Nos) under reference No. DPC/2008/2.14.1-86 from M/S British Borneo Defence - Australia through M/S Hicorp (Pvt) Ltd., and awarded the tender to the British Borneo Defence - Australia through M/S Hicorp (Pvt) Ltd., on or about 28th day of February 2008 in the knowledge of the fact that your son-in-law Danuna Thilakaratne had an interest or concern with the M/S Hicorp (Pvt) Ltd., aforesaid which relationship if disclosed, would have required you to disassociate yourself from the tender process in accordance with paragraph 1:4:2 and 1:4:3 of the Procurement Guidelines of 2006, and that you concealed the said relationship up to the date of your retirement on the 14th November 2009 and thereby you did commit a fraudulent act punishable under Section 109 of the Army Act No. 17 of 1949 (Chapter 357) of the Legislative Enactments of Sri Lanka (Ceylon) |
| **2ND CHARGE**<br>Sec 109 (e)of the Army Act | **DISGRACEFUL CONDUCT**<br><br>In that you O/50536 General GSC Fonseka being an officer of the Regular Force of the Sri Lanka Army whilst on active service being the Commander of the Sri Lanka Army served as Chairman of the Tender Board pertaining to the procurement of VHF Direction Finders (03 Nos) under reference No. DPC/2008/2.14.1/502 from M/S British Borneo Defence - Australia through M/S Hicorp (Pvt) Ltd., and awarded the tender to the British Borneo Defence - Australia through M/S Hicorp (Pvt) Ltd., on or about 23rd day of July 2008 in the knowledge of the fact that your son-in-law Danuna Thilakaratne had an interest or concern with the M/S Hicorp (Pvt) Ltd., aforesaid which relationship if |

| | |
|---|---|
| | disclosed, would have required you to disassociate yourself from the tender process in accordance with paragraph 1:4:2 and 1:4:3 of the Procurement Guidelines of 2006, and that you concealed the said relationship up to the date of your retirement on the 14th November 2009 and thereby you did commit a fraudulent act punishable under Section 109 of the Army Act No. 17 of 1949 (Chapter 357) of the Legislative Enactments of Sri Lanka (Ceylon) |
| 24th March 2010 | To be remanded for trial by General Court Martial<br><br>J. JAYASURIYA USP ndu psc<br>Lieutenant General<br>Commander of the Army |
| 31st March 2010 | To be tried by General Court Martial<br><br>MAHINDA RAJAPAKSA<br>President of the Democratic Socialist Republic of Sri Lanka |

සන්නද්ධ හමුදාවල ප්‍රධාන අණ දෙන නිලධාරියා ලෙස ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් ඉහත කී 2 වන යුධ අධිකරණය ස්ථාපිත කරන ලද්දේ, මේජර් ජෙනරාල් එම්. පී. පිරිස් එහි සභාපති ලෙසත්, මේජර් ජෙනරාල් එම්. හතුරුසිංහ එහි සාමාජිකයෙකු ලෙසත්, මේජර් ජෙනරාල් එස්. ඩබ්ලිව්. දවුලගල සාමාජිකයෙකු ලෙසත් සහ නීතිපති දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් වන රියර් අද්මිරාල් ශවේන්ද්‍ර ප්‍රනාන්දු විනිසුරු අධිනීතිඥ ජනරාල්වරයා ලෙසත්, නම් කරමිනි. යුද හමුදාවේ විනිසුරු අධිනීතිඥ ජෙනරාල්, මේජර් ජෙනරාල් ඉන්දිරා විජේරත්න එහි සිටියදීම ශ්‍රී ලංකා නාවික හමුදාවේ විනිසුරු අධිනීතිඥ ශවේන්ද්‍ර ප්‍රනාන්දු යුද හමුදා අධිකරණය සඳහා නම් කර තිබුණි.

නීතිපති දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් බුවනෙක අලුවිහාරේ විසින් පැමිණිල්ල මෙහෙය වූ අතර, හිටපු ජෙනරාල් සරත් ෆොන්සේකා වෙනුවෙන් ආරක්ෂක නීතිඥ ලෙස ජනාධිපති නීතිඥ රියන්සි අර්සකුලරත්න ක්‍රියා කරනු ලැබීය.

2010 සැප්තැම්බර් මස 17 වැනි දින, යුද අධිකරණය විසින් ඒකමතිකව ජෙනරාල් සරත් ෆොන්සේකා ඉහත කී චෝදනා 4 ට වරදකරු කොට, ඔහුව මාස 30 බරපතල වැඩ සහිතව සිරගත කිරීමට නියම කරන ලදී. ජනාධිපති මහින්ද රාජපක්ෂ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සැසිවාරයට සහභාගී වී ආපසු පැමිණි විගසම, ඔහු, ත්‍රිවිධ හමුදාවල සේනාධිනායකයා ලෙස 2010 සැප්තැම්බර් 29 වන දින ඉහත කී දඬුවම අනුමත කරනු ලැබීය.

2010 ඔක්තෝබර් 1 වන දින නාවික හමුදා මූලස්ථානයේ අත්අඩංගුවේ සිටි හිටපු ජනරාල් සරත් ෆොන්සේකා සිරකරුවෙකු ලෙස වැලිකඩ බන්ධනාගාරයට මාරු කර යවන ලදී. 2010 අප්‍රේල් මස පැවති මහ මැතිවරණයෙන් හිටපු ජනරාල් සරත් ෆොන්සේකා ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස, කොළඹ දිස්ත්‍රික්කයෙන් තේරී පත් විය.

නමුත් ඉහත කී යුධ හමුදා අධිකරණ තීන්දුව ක්‍රියා කිරීමත් සමඟම පාර්ලිමේන්තු මහ ලේකම්, ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ සහෝදරයෙකු වූ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායක චමල් රාජපක්ෂ විසින් මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයාට දන්වා සිටියේ, හිටපු ජනරාල් සරත් ෆොන්සේකාට දඬුවම් නියම කිරීම මත ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස ක්‍රියා කිරීමට ඔහුට අයිතියක් නොමැති බවය.